ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | **රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව** |
| දිනය | **2016 අගෝස්තු 04** |

## ශ්‍රී ලංකා මහ බැංකුව ප්‍රථම වරට රජයේ සුරැකුම්පත් ද්විතීයික වෙළෙඳ ගනුදෙනු තොරතුරුවල සාරාංශගත සංඛ්‍යා ලේඛන නිකුත් කිරීම

රාජ්‍ය සුරැකුම්පත් වෙළෙඳපොළ සංවර්ධනය කිරීම සඳහා වූ ප්‍රතිපත්තිමය පියවරක් ලෙසට, අද සිට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ද්විතීයික වෙළෙඳපොළ තුළ රජයේ සුරැකුම්පත් ගනුදෙනු සාරාංශගත වෙළෙඳ සංඛ්‍යා ලේඛන නිකුත් කිරීම ආරම්භ කර ඇත. ඒ අනුව, 2016 අගෝස්තු මස 01 වන දින සිට, සියලු ප්‍රාථමික අලෙවිකරුවන්, ප්‍රධාන ජාත්‍යන්තර මූල්‍ය ගනුදෙනු සහ තොරතුරු ඉලෙක්ට්‍රොනික පද්ධතියක් වන බ්ලූම්බර්ග් (Bloomberg) හරහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සංවිධානය කරන ලද වෙළෙඳ පද්ධතිය තුළ අන්තර් ප්‍රාථමික අලෙවි ගනුදෙනු වාර්තා කිරීම සිදු කළ යුතු වන්නේ ය. තවද, සියලුම ප්‍රාථමික අලෙවිකරුවන් ආයෝජකයන් සමඟ කරනු ලබන මිලියන 50 ඉක්මවන සියලුම විකුණුම් හා අදාළ තොරතුරු විනාඩි 30 ක් ඇතුළත එම පද්ධතිය වෙත වාර්තා කළ යුතු වන්නේ ය. ඒ අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව අඛණ්ඩ පදනමක් මත මෙම ගනුදෙනු අධීක්ෂණය කරමින් ඒ හා අදාළ ඵලදා අනුපාතික හා ගනුදෙනු ප්‍රමාණයන් සමඟින් වෙළෙඳ තොරතුරු සාරාංශයක්, මේ සමඟ අමුණා ඇති ආකෘතියේ පරිදි මහ බැංකු වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කරනු ඇත. ශ්‍රී ලංකා මහ බැංකුව එවැනි තොරතුරු දිනකට දෙවරක්, එනම් දවසේ මධ්‍යහ්නයේ දී හා දවස අවසානයේ දී මෙම පද්ධතිය සම්පූර්ණයෙන් ම ක්‍රියාත්මක වීමත් සමඟ යථා කාලයේ දී නිකුත් කිරීමට සැලසුම් කර ඇත. ආයෝජකයන්ට අනෙකුත් මූල්‍ය වෙළෙඳපොළ සහ ආර්ථික තොරතුරු සමඟ රජයේ සුරැකුම්පත් වෙළෙඳපොළ තත්ත්වයන්ගේ වත්මන් තත්ත්වය අධ්‍යයනය කර, ඔවුන්ගේ ආයෝජන සම්බන්ධයෙන් වඩා දැනුවත් තීරණ ගැනීමට මෙම තොරතුරු උපකාරී වනු ඇත. එවැනි වෙළෙඳපොළ තොරතුරු පැවතීම හරහා, අනෙකුත් මූල්‍ය වෙළෙඳපොළවල් හා සමගාමීව, රජයේ සුරැකුම්පත්

වෙළෙඳපොළෙහි විනිවිදභාවය තවදුරටත් ඉහළ යමින් මිල අනාවරණය හා පුළුල් පරාසයක් තුළ වෙළෙඳපොළ පැතිර යෑම සිදු වනු ඇත. ප්‍රාථමික අලෙවිකරුවන් නොවන බැංකු විසින් ඔවුන්ගේ ගනුදෙනුකරුවන්ට කරනු ලබන ද්විතීයික වෙළෙඳපොළ රජයේ සුරැකුම්පත් අලෙවියන් ද යථා කාලයේ දී මෙම පද්ධතියට ඇතුළත් කරනු ලැබේ.

මීට අමතරව, තවදුරටත් රජයේ සුරැකුම්පත් වෙළෙඳපොළ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව සංවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනෙකුත් සංවර්ධිත මූල්‍ය වෙළෙඳපොළවල් පරිද්දෙන් වෙළෙඳපොළ තොරතුරු තත්කාලීන පදනම මත සැපයීම සඳහා විමධ්‍යගත ගනුදෙනු පද්ධතිය හා සමගාමීව විද්‍යුත් වෙළෙඳ පද්ධතියක් පිහිටුවීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලියක් ආරම්භ කර ඇත. මේ අතර, ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව වෙළෙඳපොළ නියාමනය හා අධීක්ෂණය ශක්තිමත් කිරීමට ක්‍රියාමාර්ග කිහිපයක් ගෙන ඇත. ඒ අනුව, රජයේ සුරැකුම්පත් වෙළෙඳපොළ නියාමනය හා අධීක්ෂණය බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පවරා ඇති අතර රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ කාර්යයභාරය ණය නිකුත් කිරීම්, ලේඛනගත කිරීම, වෙළෙඳපොළ සංවර්ධනය හා ණය කළමනාකරණය යන විෂයයන් සඳහා පමණක් සීමා වනු ඇත.  මෙම ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගයන් හරහා සාධාරණ වෙළෙඳපොළ පරිචයන් ප්‍රවර්ධනය වීමත් සියලුම රජයේ සුරැකුම්පත් වෙළෙඳපොළ සහභාගීකරුවන් වෙත තවදුරටත් ඵලදා ලාභයන් ලබාදීමත් සිදුවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව
## රජයේ සුරැකුම්පත් ද්විතීයික වෙළෙඳපොළ ගනුදෙනු සාරාංශය* 2016.08.03

| දර්ශකය | 2016.08.03 | 2016.08.02 |
|---|---|---|
| සම්පූර්ණ පිරිවැටුම | 7,640 | 4,752 |
| ගනුදෙනු සංඛ්‍යාව | 47 | 48 |
| ගනුදෙනු සුරැකුම්පත් සංඛ්‍යාව | 15 | 12 |
| සහභාගී වූවන් සංඛ්‍යාව | 17 | 16 |

| අංකය | ISIN | කල්පිරුම | ආරම්භක ඵලදා අනුපාතය % | අවසාන ඵලදා අනුපාතිකය % | උපරිම ඵලදා අනුපාතිකය % | අවම ඵලදා අනුපාතිකය % | බර තබන ලද සාමාන්‍ය ඵලදා අනුපාතය % | ප්‍රමාණය (රුමිලියන) | ගනුදෙනු සංඛ්‍යාව | සුරැකුම්පත් වර්ගය |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | LKA18216H120 | දින 9 | 8.60 | 8.60 | 8.60 | 8.60 | 8.60 | 2,500 | 2 | භා.බිල්පත් |
| 2 | LKA18217B030 | දින 182 | 9.82 | 9.82 | 9.82 | 9.82 | 9.82 | 100 | 1 | භා.බිල්පත් |
| 3 | LKA36417H049 | දින 364 | 10.65 | 10.70 | 10.70 | 10.65 | 10.68 | 600 | 2 | භා.බිල්පත් |
| 4 | LKB00517F157 | අවුරුදු 1 | 10.75 | 10.75 | 10.75 | 10.75 | 10.75 | 50 | 1 | භා.බැඳුම්කර |
| 5 | LKB00617G153 | අවුරුදු 1 | 10.75 | 10.75 | 10.75 | 10.75 | 10.75 | 50 | 1 | භා.බැඳුම්කර |
| 6 | LKB00418J150 | අවුරුදු 2 | 11.15 | 11.15 | 11.15 | 11.15 | 11.15 | 100 | 1 | භා.බැඳුම්කර |
| 7 | LKB00619I155 | අවුරුදු 3 | 11.65 | 11.65 | 11.65 | 11.65 | 11.65 | 50 | 1 | භා.බැඳුම්කර |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 8 | LKB01020H017 | අවුරුදු 4 | 11.85 | 11.65 | 11.85 | 11.65 | 11.70 | 200 | 2 | හා.බැඳුම්කර |
| 9 | LKB00521C016 | අවුරුදු 5 | 12.00 | 11.96 | 12.00 | 11.95 | 11.97 | 1,250 | 11 | හා.බැඳුම්කර |
| 10 | LKB00922J011 | අවුරුදු 6 | 12.07 | 12.07 | 12.07 | 12.07 | 12.07 | 250 | 1 | හා.බැඳුම්කර |
| 11 | LKB01023I019 | අවුරුදු 7 | 12.29 | 12.10 | 12.29 | 12.10 | 12.17 | 140 | 2 | හා.බැඳුම්කර |
| 12 | LKB00824H013 | අවුරුදු 8 | 12.41 | 12.75 | 12.75 | 12.36 | 12.44 | 1,500 | 14 | හා.බැඳුම්කර |
| 13 | LKB01025C157 | අවුරුදු 9 | 12.65 | 12.65 | 12.65 | 12.65 | 12.65 | 400 | 1 | හා.බැඳුම්කර |
| 14 | LKB01226F014 | අවුරුදු 10 | 12.58 | 12.58 | 12.58 | 12.58 | 12.58 | 50 | 1 | හා.බැඳුම්කර |
| 15 | LKB01026H014 | අවුරුදු 10 | 12.71 | 12.68 | 12.72 | 12.66 | 12.69 | 400 | 6 | හා.බැඳුම්කර |

*(අ) අන්තර් ප්‍රාථමික වෙළෙඳ ගනුදෙනු (ආ) ප්‍රාථමික අලෙවිකරුවන් හා ප්‍රාථමික අලෙවිකරුවන් නොවන්නන් අතර රු.මිලියන 50 කට වැඩි අගයකින් යුතුව සිදුවන ගනුදෙනු පමණක් ඇතුළත් වෙයි.

